# සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

**සබරගමුව පළාත් සභා අර්ධ රාජ්‍ය සේවයේ කළමණාකරු (මෙහෙයුම්) II ශ්‍රේණියට බඳවාගැනීම**

**කළමනාකරු (මෙහෙයුම්) MM 1 – 1 තනතුරු සංඛ්‍යාව 01**

**මූලික සුදුසුකම්**

- **බාහිර අයදුම්කරුවන්**

ප්‍රවාහනය හා සැපයුම් සේවා/තොරතුරු තාක්ෂණය / මෙහෙයුම් හා තාක්ෂණ කළමනාකරණය යන, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින්, විශ්ව විද්‍යාල ප්‍රතිපාද කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු පොදු මගී ප්‍රවාහන සේවා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

- **අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 )**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. "කණිෂ්ඨ කළමනාකාර" JM සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**මාසික වැටුප් ප්‍රමාණය** : **MM 1–1 රු: 91,690 - 10 X 2,480 – 15 X 3,450 - 168,240/= වන අතර කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 01/2025 යටතේ කටයුතු කරනු ලැබේ**

**වෙනත් කොන්දේසි**

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුන (03)කට නොඅඩු කාලයක් සබරගමු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි.
3. අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.
4. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම සබරගමු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
5. රජයේ දෙපාර්තමේන්තු හෝ ව්‍යවස්ථාපිත ආයතනවල අපේක්ෂකයින් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය.
6. පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන්ගේ කාර්ය සාධනය මත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.
7. සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වැටුපෙන් 12% ක් සේවක භාරකාර අරමුදලට දායක වන අතර, සේවකයාගත් සේවක අර්ථසාධක අරමුදලට 8% ක් දායක විය යුතු අතර වැටුපෙන් 3% ක් සේවක භාරකාර අරමුදලට ආයතනය දායක වන්නෙමු.
8. ඉහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් විසින් සකස් කරන ලද අයදුම්පත්, ඔවුන්ගේ අධ්‍යාපනික, වෘත්තීය සහ පළපුරුද්ද සහතිකවල පිටපත්, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමඟ එවිය යුතුය.
9. බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ අනුමැතියට අනුව අභ්‍යන්තර අපේක්ෂකයින්ට ද ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් කළ හැකිය.
10. අයදුම්පත, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන ලද තනතුර සලකුණු කර, ලියාපදිංචි තැපෑලෙන් සභාපති, සබරගමුව මාර්ග මගී ප්‍රවාහන අධිකාරිය, පළාත් සංකීර්ණය, නව නගරය, රත්නපුර යන ලිපිනයට 2025.11.12 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි එවිය යුතුය.
11. ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවන සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති,
ප්‍රධාන කාර්යාලය,
සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,
2025.10.22